# (ආ) කාර්මික නිෂ්පාදනය

## 1. හැඳින්වීම

කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයෙහි ලියා පදිංචි කොට ඇති, කර්මාන්ත ඒකක වෙත තැපැලෙන් යවන ලද ප්‍රශ්න මාලාවක් මගින්, 1971 වර්ෂයේදී පෞද්ගලික හා පොදු අංශවල කාර්මික නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ තොරතුරු රැස්කර ගන්නා ලදී. අවශ්‍ය අවස්ථාවන්හිදී කාර්මික ඒකකයනට පෞද්ගලිකව යාමද, කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය විසින් සංඛ්‍යා තොරතුරු සැපයීමද සංඛ්‍යා තොරතුරු යුහුසුළුව රැස්කර ගැනීමෙහිලා ආධාරෝපකාරී විය.

කර්මාන්ත ක්ෂෙත්‍රයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ මෙම සමීක්ෂණයෙහි අරමුණ වනුයේ, විවිධ කර්මාන්ත අංශයන්හි ප්‍රගතිය විශ්ලේෂණය කිරීම, සමස්ථ කාර්මික වර්ධනයට ඒ ඒ අංශවලින් ඉටුවූ මෙහෙය පිරික්සීම හා නිෂ්පාදනය, සේවා නියුක්තිය, වැටුප් ශ්‍රමික පැය ගණන් පාවිච්චි කරන ලද ඉන්ධන හා බලය වෙනුවෙන් දරන ලද වියදම හා අමුද්‍රව්‍ය යන ප්‍රධාන ලක්ෂණයන් කෙරෙහි අවධානය යොමු කිරීමය.

1971 වර්ෂයේදී කර්මාන්ත ක්ෂේත්‍රයේ ක්‍රියාවලිය අගැයීමට පෙර එම වර්ෂය තුළදී කර්මාන්ත අංශය කෙරෙහි එල්ල වූනු බාධක සමහරක් පිළිබඳව සඳහන් කිරීම වටනේය. කාර්මික නිෂ්පාදනය කෙරෙහි මෙතෙක් බලපැවැත්වූයේ විදේශීය විනිමය හිඟවීම හේතු කොට ගෙන විදේශීය අමුද්‍රව්‍ය සලාකයන් කපා හැරීම වැනි අවහිරකමය. 1971 දී ලබා ගත හැකිවූ විදේශීය අමුද්‍රව්‍ය සලාකය සීමිතවීමට අමතර වශයෙන් වර්ෂයේ මුල් භාගයේදී රට තුළ ඇතිවූ කලබලකාරී තත්ත්වය නිසා කාර්මික ක්‍රියාවලියේ තවත් පසු බෑමක් සිදුවිය. එහෙත් මෙවැනි අවහිරකම් මධ්‍යයේ වුවද කාර්මික නිෂ්පාදන ප්‍රවණතාවය දිගින් දිගටම පවත්වා ගෙන යාමත් ඇතැම් කර්මාන්ත ගණයන්හි ප්‍රගතියක් පවා ලබා තිබීමත් සැළකිය යුතු කරුණකි.

වාර්තා සැපයූ කර්මාන්ත ඒකක 1,897 ක මුළු නිමැවුම් වටිනාකම රුපියල් දශලක්ෂ 1,945.0 ක්වූ 1970 වර්ෂයේ මට්ටමේ සිට 1971 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 2,239·4 දක්වා ඉහළ නැංගේය. මෙයින් සියයට 15·1 වැඩිවීමක් හෙවත් 1970 වර්ෂයේ වර්ධනයට වඩා සියයට 7 ක පමණ වැඩිවීමක් පිළිබිඹු වේ.

මුළු කාර්මික නිෂ්පාදිතයෙහි පොදු අංශයේ කොටස 1970 දී වූ සියයට 31·0 මට්ටමේ සිට 1971 දී සියයට 30·3 දක්වා අඩුවිය. 1971 වර්ෂයේදී වූ වර්ධනයට පොදු අංශය සියයට 41·0 කින් දයක විය. කාර්මික නිමැවුම් වටිනාකමෙහි වැඩිවීමට තරමක් දුරට හේතු වූයේ අමුද්‍රව්‍යවල මිල ඉහළයාම ලෙස දැක්විය හැකිය. අමුද්‍රව්‍යවල මිලෙහි ඉහළ යාමේ උපනතියක් දක්වූනු අතර ඒ හේතු කොට ගෙන නිෂ්පාදිත භාණ්ඩවල මිලෙහි ඉහළ යාමක් සිදුවිය.

## 2. ප්‍රධාන උපනතීන්

### කර්මාන්ත ප්‍රතිපත්ති

1970 වර්ෂයේ මහ බැංකු වාර්තාවේ, කාර්මික නිෂ්පාදනය යටතේ ලියැවුනු කොටසෙහි, රජය විසින් ගෙන ඇති කර්මාන්ත සංවර්ධනයට අදළ වන ප්‍රතිපත්ති තීරණ තුනක් පිළිබඳව විශේෂයෙන් සඳහන් කොට ඇත. එම තීරණ නම්—

(අ) දේශීය අමුද්‍රව්‍ය වැඩි වශයෙන් පාවිච්චියට ගැනෙන කර්මාන්තයන් දිරි ගැන්වීම හා නගා සිටුවීම.

---

1. මෙම කොටසෙහි නිෂ්පාදනය යනුවෙන් සඳහන් වනුයේ නිෂ්පාදන වටිනාකම විනා භාණ්ඩමය නිමැවුම නොවේ. පිරිවැටුම බදු වැඩිවීම සහ අමුද්‍රව්‍ය මිළ ඉහළ යෑම නිෂ්පාදන වටිනාකම කෙරෙහි බලපා ඇත.

(ආ) දේශීය කර්මාන්තකරුවන් වෙත බෙදා හැරීම සඳහා කාර්මික අමුද්‍රව්‍ය හැකි සෑම විටම තොග වශයෙන් රජය විසින් ආනයනය කිරීමේ හැකියාවන් පිරික්සීම.

(ඇ) නිෂ්පාදිත භාණ්ඩවල තත්ත්වය හා මිල පාලනය කිරීම.

මෙම ප්‍රතිපත්ති තීරණ දැනට ක්‍රියාත්මක කොට ඇත.

දේශීය අමුද්‍රව්‍ය පාවිච්චිය සම්බන්ධයෙන් සඳහන් කළ යුත්තේ, සමහර කර්මාන්තයන් විසින් දේශීය අමුද්‍රව්‍ය පෙරට වඩා වැඩියෙන් උපයෝගි කොට ගැනීමේ හා භාණ්ඩ සවි කිරීම සඳහා කොටස් සහ මෙවලම් දේශීයව නිපදවීමේ ලකුණු දැනටමත් දක්වෙන බවය. දේශීය අමුද්‍රව්‍ය උපයෝගි කොට ගන්නා කර්මාන්තයන් දිරිගැන්වීමේ රජයේ ප්‍රතිපත්තියෙන් බලාපොරොත්තුවූ ප්‍රතිඵල ලැබේ යයි විශ්වාස කෙරේ.

**කර්මාන්තයන්හි පිහිටීම**

1970 මහ බැංකු වාර්ෂික වාර්තාවේද සඳහන් කොට ඇති පරිදි, කාර්මික ඒකකයන්ගෙන් ඉතා විශාල ප්‍රතිශතයක්, විශේෂයෙන් අගනුවරට ආසන්නව බස්නාහිර පළාතේ පිහිටා ඇත. ප්‍රාදේශීය වශයෙන් පුළුල්ව බෙදී ගිය කර්මාන්තයන් පිහිටුවීම පිළිබඳ මෑතකදී ඇති කරගත් ආණ්ඩුවේ ප්‍රතිපත්තියේ ප්‍රතිඵල ගැන කරුණු දක්වීමට තරම් තවමත් කාලය එළඹී නොමැත. බස්නාහිර පළාතේ පිහිටුවා ඇති මුළු කර්මාන්ත ඒකක සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ 1970 දී මුළු ඒකක සංඛ්‍යාව සියයට 81.3 ක්වූ අතර 1971 දී එය සියයට 78·9 දක්වා අඩුවී ඇති බව 2 (අ) 8 සංඛ්‍යා සටහනෙහි සංඛ්‍යා තොරතුරුවලින් දක්වේ. ඒකක සංඛ්‍යාවේ වැඩිවීම් දක්වූ පළාත් නම්, සබරගමුව (සියයට 0·2 සිට 1·7 දක්වා) මධ්‍යම (සියයට 4·9 සිට 5·6 දක්වා) උතුරු (සියයට 3·3 සිට 3·8 දක්වා) සහ දකුණු (සියයට 5·2 සිට 5·5 දක්වා) වෙයි.

ගම්බද පළාත්හි කර්මාන්ත ඒකකයන් විසුරුවා හැරීමෙන් තදබදය සහ ඒ හා සමග උද්ගත වන සමාජයීය ප්‍රශ්න ලිහිල්වනවා පමණක්ම නොව, එම පළාත්වල පවත්නා සේවා වියුක්තිය හා ඌන සේවා නියුක්තියද තරමක් දුරට මග හැරෙනු ඇත.

**නිෂ්පාදනය**

II (ආ) 1 දරන සංඛ්‍යා සටහනෙහි ලැයිස්තු ගත කොට ඇති කර්මාන්ත ගණයන් 9 යම 1970 දී මෙන්, 1971 දී වාර්තාගතවූ රුපියල් දශලක්ෂ 294·4 ක නිෂ්පාදන වටිනාකම වැඩි කිරීමෙහිලා දයක විය. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් දයකවූ කර්මාන්ත ගණ දෙක වූයේ, රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත (සියයට 41·6 ක්) සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ (සියයට 19·8) ය. මෙම ගණ දෙකෙහි නිමැවුම 1971 දී මුළු කාර්මික නිෂ්පාදනයෙන් සියයට 58·3 ක් විය.

ප්‍රධාන කර්මාන්ත ගණයන් යටතේ ගැනෙන උප ගණයන්ට අදළ සංඛ්‍යා තොරතුරු, II (ආ) 2 සංඛ්‍යා සටහනෙහි දක්වේ. ආහාර, පාන වර්ග සහ දුම්කොළ, ප්‍රධාන ගණයෙහි නිමැවුම් ඉහළ යෑමට හේතු වූයේ, දුම්කොළ සහ එළවළු තෙල් සහ මේද හා සැකසූ ආහාර යන උප ගණයන්හි නිමැවුමයි. මෙම ගණයෙහි එක් උපගණයක්, එනම්, කල්තබා ගත හැකි හා ටින්වල අසුරන ලද පලතුරු, එළවළු, මස්, මාළු සහ අනෙකුත් මුහුදු ආහාර උප ගණයේ නිමැවුම් වටිනාකමේ සියයට 100 කින් කැපී පෙනෙන ලෙස වැඩිවී ඇත. මෙම නිෂ්පාදිතයන්ගේ දේශීය පාරිභෝජනය ඉහළ යාමට අතිරේකව, ලංකාවේ නිෂ්පාදනය කළ ටින්වල අසුරන ලද හා කල්තබා ගත හැකි ආහාර වෙනුවෙන් විදේශීය වෙළෙඳ පොලවල ඇති ඉල්ලුම ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින හෙයින් මෙය පුදුමවීමට කරුණක් නොවේ. මේ අතර කල්තබා ගත හැකි සහ ටින්වල අසුරන ලද ආහාර නිෂ්පාදිතවලින් සියයට 8 ක් පමණ අපනයන කරනු ලැබේ. මේ වූ කලි පුළුල් කිරීමේ හැකියාවක් ඇති එමෙන්ම වැදගත් විදේශීය විනිමය උත්පාදන මාර්ගයක් වශයෙන් දියුණු කළ හැකි එක් කර්මාන්තයකි. රෙදිපිළි ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත ගණයෙහි නූල් කැටීම, රෙදි පිළි වියීම සහ නිම කිරීම හා ගොතන

# 1968-71 කාර්මික නිෂ්පාදනය හා

| කාර්මික ගණය | සමාගම් ගණන | | | | සේවක සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1968 | 1969 | 1970 | 1971 | 1968 | 1969 | 1970 | 1971 |
| I. ආහාර, පානවර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. .. | 588* | 654 | 649 | 527 | 24878 | 31889 | 33734 | 24505 |
| II. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත . .. | 496 | 537 | 530 | 634 | 35528 | 25469 | 27069 | 22568 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. .. | 20 | 15 | 11 | 15 | 2575 | 3393 | 2907 | 4127 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය .. .. | 90 | 95 | 74 | 74 | 4146 | 4876 | 4462 | 4645 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන් .. | 284 | 276 | 244 | 244 | 11213 | 12414 | 13610 | 14423 |
| VI. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදනයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 53 | 75 | 67 | 51 | 6084 | 7811 | 8545 | 9929 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් .. .. | 1 | 1 | 1 | 1 | 950 | 960 | 963 | 952 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදනය .. .. | 253 | 282 | 228 | 287 | 15529 | 16119 | 12448 | 15039 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක නොසඳහන්) .. | 19 | 27 | 49 | 64 | 445 | 795 | 1367 | 2127 |
| එකතුව | 1804 | 1962 | 1853 | 1897 | 101348 | 103726 | 105105 | 98365 |

* ආයතන 365 ක් සඳහා වැටුප් බිල

II (ආ) 1 සංඛ්‍යා සටහන

# සේවා නියුක්ති සංඛ්‍යාමය විස්තර සම්පිණ්ඩනය

| ශ්‍රමික දින එකතුව (දහස් ගණනින්) | | | | වැටුප් බිල (රුපි. දශ ලක්ෂ) | | | | නිෂ්පාදන වටිනාකම (රුපි. දශ ලක්ෂ) | | | | ශ්‍රමික දින වැටුප් (රුපියල්) | | | | සේවකයෙකුට වෙන්වන ශ්‍රමික දින | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1968 | 1969 | 1970 | 1971 | 1968 | 1969 | 1970 | 1971 | 1968 | 1969 | 1970 | 1971 | 1968 | 1969 | 1970 | 1971 | 1968 | 1969 | 1970 | 1971 |
| 7122 | 8982 | 9651 | 5604 | 46·8 | 58·3 | 64·4 | 59·8 | 609·6 | 641·8 | 684·5 | 743·0 | 6·57 | 6·49 | 6·67 | 10·67 | 286 | 282 | 286 | 229 |
| 9301 | 6433 | 7352 | 5254 | 46·0 | 31·8 | 46·0 | 43·3 | 224·3 | 267·1 | 282·7 | 306·2 | 4·95 | 4·94 | 6·25 | 8·24 | 262 | 253 | 272 | 233 |
| 752 | 949 | 738 | 798 | 6·6 | 7·0 | 8·8 | 8·8 | 16·9 | 18·0 | 21·2 | 26·6 | 8·78 | 7·38 | 11·89 | 11·03 | 292 | 280 | 254 | 193 |
| 1187 | 1412 | 1195 | 1228 | 8·9 | 10·8 | 10·7 | 11·9 | 54·6 | 62·3 | 65·0 | 70·3 | 7·50 | 7·65 | 8·92 | 9·69 | 286 | 290 | 268 | 264 |
| 3124 | 3459 | 3782 | 3607 | 30·8 | 34·1 | 39·1 | 48·0 | 203·3 | 249·8 | 439·2 | 561·7 | 9·86 | 9·86 | 10·33 | 13·31 | 279 | 279 | 278 | 250 |
| 1670 | 2131 | 2287 | 2193 | 17·1 | 18·6 | 26·1 | 25·8 | 92·8 | 123·3 | 138·8 | 176·4 | 10·24 | 8·73 | 11·42 | 11·76 | 275 | 273 | 268 | 221 |
| 260 | 288 | 270 | 220 | 3·4 | 4·0 | 2·8 | 4·7 | 27·3 | 23·8 | 38·9 | 58·6 | 13·08 | 13·89 | 10·55 | 21·36 | 274 | 300 | 280 | 231 |
| 3932 | 4501 | 3320 | 3960 | 28·2 | 33·7 | 29·4 | 39·8 | 167·1 | 226·2 | 256·1 | 273·5 | 7·17 | 7·49 | 8·87 | 10·05 | 253 | 279 | 267 | 262 |
| 114 | 212 | 395 | 474 | 0·6 | 1·2 | 2·1 | 2·9 | 2·7 | 9·5 | 18·6 | 23·1 | 5·26 | 5·66 | 5·40 | 6·12 | 256 | 267 | 289 | 223 |
| 27462 | 28367 | 28990 | 23338 | 188·4 | 199·5 | 229·4 | 245·0 | 1398·6 | 1626·8 | 1945·0 | 2239·4 | 6·86 | 7·03 | 7·91 | 10·08 | 271 | 273 | 276 | 237 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 1967/71 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම කර්මාන්තවල

| කාර්මික ගණය | නිෂ්පාදන වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | | |
|---|---|---|---|---|---|
| | 1967 | 1968 | 1969 | 1970 | 1971 |
| 1. ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. | 422·3 | 609·6 | 641·8 | 684·5 | 743·0 |
| (අ) සැකසූ ආහාර .. .. .. | 130·6 | 250·0 | 230·5 | 250·6 | 263·2 |
| (ආ) එළවළු තෙල් වර්ග සහ මේද .. .. | 139 7 | 162·0 | 169·5 | 170·1 | 190·4 |
| (ඇ) කල්තබාගත හැකි සහ ටින්වල අසුරන ලද පළතුරු, එළවළු, මස් මාළු සහ අනෙකුත් මුහුදු ආහාර .. | 6·7 | 8·4 | 8·6 | 11·8 | 23·2 |
| (ඈ) බිස්කෝතු, කොකෝවා, චොකලට් සහ සීනි රසකැවිලි | 33·3 | 44·3 | 49·9 | 50·5 | 53·1 |
| (ඉ) පාන වර්ග සහ ස්ප්‍රීතු .. .. .. | 20·0 | 34·4 | 77·4 | 94·9 | 88·2 |
| (ඊ) දුම්කොළ .. .. .. | 92·0 | 110·5 | 105·9 | 106·6 | 124·9 |
| 2. රෙදිපිලි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. | 177·1 | 224·3 | 267·1 | 282·7 | 306·2 |
| (අ) ගොතන ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් හා අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) .. .. | 48·1 | 55·7 | 56·0 | 64·3 | 70·8 |
| (ආ) නූල් කැටීම, රෙදිපිළි විවීම සහ නිම කිරීම .. | 97·1 | 136·2 | 172·2 | 173·3 | 189·4 |
| (ඇ) පාවහන් සහ සම නිෂ්පාදිතයන් .. .. | 31·9 | 32·4 | 38·9 | 45·1 | 46·0 |
| 3. දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදනය (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 10·4 | 16·9 | 18·0 | 21·2 | 26·6 |
| (අ) දැව නිෂ්පාදිත .. .. .. | 3·6 | 8·0 | 9·2 | 10·4 | 12·8 |
| (ආ) තුනී ලෑලි .. .. .. | 6·8 | 8·9 | 8·8 | 10·8 | 13·8 |
| 4. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ .. .. .. | 34·7 | 54·6 | 62·3 | 65·0 | 70·3 |
| 5. රසායනික, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය .. .. .. | 136·7 | 203·3 | 249·8 | 439·2 | 561·7 |
| (අ) කාර්මික රසායන ද්‍රව්‍ය .. .. .. | 1·9 | 2·3 | 2·2 | 3·1 | 3·3 |
| (ආ) විවිධ රසායනික නිෂ්පාදිතයන් .. .. | 98·2 | 118·9 | 155·6 | 155·9 | 230·3 |
| (ඇ) පෙට්‍රෝලියම් සහ ගල්අඟුරු නිෂ්පාදිතයන් .. | – | 8·3 | 11·0 | 191·0 | 198·5 |
| (ඈ) රබර් නිෂ්පාදිතයන් .. .. .. | 20·7 | 41·3 | 52·8 | 56·4 | 91·9 |
| (ඉ) ප්ලාස්ටික් නිෂ්පාදිතයන් .. .. .. | 15·9 | 32·5 | 28·2 | 32·8 | 37·7 |
| 6. ලෝහ නොවන ඛනිජ භාණ්ඩ නිෂ්පාදනය (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. .. | 69·5 | 92·8 | 123·3 | 138·8 | 176·4 |
| (අ) පිඟන් බඩු .. .. .. | 4·4 | 8·5 | 8·7 | 8·0 | 8·5 |
| (ආ) වීදුරු සහ වීදුරු නිෂ්පාදිතයන් .. .. | – | 4·8 | 7·7 | 8·1 | 13·9 |
| (ඇ) සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිතයන් සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන් .. .. | 53·5 | 70·0 | 89·0 | 104·8 | 116·7 |
| (ඈ) ඉල්මනයිට් නිෂ්පාදනය .. .. .. | 1·4 | 2·2 | 3·1 | 4·7 | 6·2 |
| (ඉ) ගඩොල් සහ උළු .. .. .. | 10·2* | 7·3 | 14·8 | 13·2 | 31·1 |
| 7. මූලික ලෝහ භාණ්ඩ .. .. .. | – | 27·3 | 28·8 | 38·9 | 58·6 |
| (අ) යකඩ සහ වානේ මූලික කර්මාන්ත .. .. | – | 27·3 | 28·8 | 38·9 | 58·6 |
| 8. සකස්කරන ලද ලෝහභාණ්ඩ සහ යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය | 102·0 | 167·1 | 226·2 | 256·1 | 273·5 |
| (අ) සකස් කරන ලද ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) | 54·1 | 79·4 | 82·0 | 96·9 | 128·0 |
| (ආ) යන්ත්‍ර සූත්‍ර (විදුලි නොවන යන්ත්‍රසූත්‍ර) සහ ප්‍රවාහන උපකරණ .. .. .. | 19·8 | 45·9 | 77·9 | 70·8 | 57·3 |
| (ඇ) විදුලි යන්ත්‍ර සූත්‍ර, මෙවලම් උපකරණ හා සැපයුම් .. | 28·1 | 41·8 | 66·3 | 88·4 | 88·2 |
| 9. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවූ) .. | 1 5 | 2·7 | 9·5 | 18·6 | 23·1 |
| එකතුව .. .. .. | 954·2 | 1398·6 | 1,626·8 | 1,945.0 | 2239·4 |

* වීදුරු සහ වීදුරු භාණ්ඩ ඇතුලත් වේ.

II (ආ) 2 සංඛ්‍යා සටහන

ස්වරූපය හා ප්‍රධාන නිෂ්පාදන අනුව වර්ග කොට

| කර්මාන්තයෙහි සියයට ගණන | | | | | මුළු කාර්මික නිෂ්පාදනයේ සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1967 | 1968 | 1969 | 1970 | 1971 | 1967 | 1968 | 1969 | 1970 | 1971 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 44·3 | 43·6 | 39·5 | 35·2 | 33·2 |
| 30·9 | 41·0 | 35·9 | 36·6 | 35·4 | 13·3 | 17·9 | 14·2 | 12·0 | 11·8 |
| 33·1 | 26·6 | 26·4 | 24·9 | 25·6 | 13·0 | 11·6 | 10·4 | 8·7 | 8·5 |
| 1·6 | 1·4 | 1·3 | 1·7 | 3·1 | 0·7 | 0·6 | 0·5 | 0·6 | 1·0 |
| 7·9 | 7·3 | 7·8 | 7·4 | 7·2 | 3·5 | 3·2 | 3·1 | 2·6 | 2·4 |
| 4·7 | 5·6 | 12·1 | 13·9 | 11·9 | 2·8 | 2·4 | 4·8 | 4·9 | 3·9 |
| 21·8 | 18·1 | 16·5 | 15·6 | 16·8 | 8·9 | 7·9 | 6·5 | 5·5 | 5·6 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 18·6 | 16·0 | 16·4 | 14·5 | 13·7 |
| 27·2 | 24·8 | 21·0 | 22·7 | 23·1 | 5·0 | 4·0 | 3·4 | 3·3 | 3·2 |
| 54·8 | 60·7 | 64·5 | 61·3 | 61·9 | 10·2 | 9·7 | 10·6 | 8·9 | 8·5 |
| 18·0 | 14·5 | 14·5 | 16·0 | 15·0 | 3·4 | 2·3 | 2·4 | 2·3 | 2·0 |
| 100·0 | 100·0 | 100·0 | 100 0 | 100·0 | 1·1 | 1·2 | 1·1 | 1·1 | 1·2 |
| 34·6 | 47·3 | 51·1 | 49·1 | 48·1 | 0·4 | 0·6 | 0·6 | 0·5 | 0·6 |
| 65·4 | 52·7 | 48·9 | 50·9 | 51·9 | 0·7 | 0·6 | 0·5 | 0·6 | 0·6 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 3·6 | 3·9 | 3·8 | 3·3 | 3·1 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 14·3 | 14·5 | 15·3 | 22·6 | 25·1 |
| 1·4 | 1·1 | 0·9 | 0·7 | 0·6 | 0·2 | 0·2 | 0·1 | 0·2 | 0·1 |
| 71·8 | 58·5 | 62·3 | 35·5 | 41·0 | 10·3 | 8·5 | 9·6 | 8·0 | 10·3 |
| – | 4·1 | 4·4 | 43·5 | 35·3 | – | 0·6 | 0·7 | 9·8 | 8·9 |
| 15·2 | 20·3 | 21·1 | 12·8 | 16·4 | 2·2 | 3·0 | 3·2 | 2·9 | 4·1 |
| 11·6 | 16·0 | 11·3 | 7·5 | 6·7 | 1·6 | 2·3 | 1·7 | 1·7 | 1·7 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 7·3 | 6·6 | 7·6 | 7·1 | 7·9 |
| 6·3 | 9·1 | 7·1 | 5·8 | 4·8 | 0·5 | 0·6 | 0·5 | 0·4 | 0·4 |
| – | 5·2 | 6·2 | 5·8 | 7·9 | – | 0·3 | 0·5 | 0·4 | 0·6 |
| 77·0 | 75·4 | 72·2 | 75·5 | 66·2 | 5·6 | 5·0 | 5·5 | 5·4 | 5·2 |
| 2·0 | 2·4 | 2·5 | 3·4 | 3·5 | 0·1 | 0·2 | 0·2 | 0·2 | 0·3 |
| 14·7 | 7·9 | 12·0 | 9·5 | 17·6 | 1·1 | 0·5 | 0·9 | 0·7 | 1·4 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | – | 2·0 | 1·8 | 2·0 | 2·6 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | – | 2·0 | 1·8 | 2·0 | 2·6 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 10·7 | 12·0 | 13 9 | 13·2 | 12 2 |
| 53·0 | 47·5 | 36·3 | 37·8 | 46·8 | 5·7 | 5·7 | 5·0 | 5 0 | 5·7 |
| 19·4 | 24·2 | 34·4 | 27·6 | 21·0 | 2·1 | 3·3 | 4·8 | 3·6 | 2·6 |
| 27·5 | 28·3 | 29·3 | 34·5 | 32·2 | 2·9 | 3·0 | 4·1 | 4·5 | 3·9 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 0·1 | 0·2 | 0·6 | 1·0 | 1·0 |
| | | | | | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100 ·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් උප ගණවල නිමැවුමේ සුළු වැඩිවීමක් සටහන් විය, කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත ගණයේ නිමැවුමෙහි සියයට 50 ක වැඩිවීමට රාජ්‍ය ව්‍යවසායක් දායකවූ අතර, ඉතිරි කොටසට ඇසුරුම් සහ එතීමේ කඩදාසි කර්මාන්ත දායකවූහ.

ප්‍රධාන කර්මාන්ත ගණයන් 9 ය අතුරෙන් නිමැවුම අතින් ඉහළම වැඩිවීම සටහන් වී ඇත්තේ රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත ගණයේය. මෙම ගණයේ නිමැවුම 1970 දීවූ රුපියල් දශලක්ෂ 439.2 මට්ටමේ සිට 1970 දී රුපියල් දශලක්ෂ 561.7 දක්වා වැඩිවී ඇත. සියයට 27 ක මෙම වැඩිවීමට මුළුමනින්ම දායක වී ඇත්තේ විවිධ රසායනික නිෂ්පාදිත හා රබර් නිෂ්පාදිත යන උප ගණයන් දෙකය. විවිධ රසායනික නිෂ්පාදිත උප ගණයෙහි නිමැවුම සියයට 47.7 කින් සැළකිය යුතු අන්දමෙන් ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ තීන්ත, සබන් සහ සුවඳ විලවුන් නිෂ්පාදනය ඉහළ යාමයි.

රබර් නිෂ්පාදිත ගණයේ නිමැවුම් වටිනාකමේ ඊටත් වඩා වැදගත් එනම් සියයට 63 ක වැඩිවීමක් සටහන්වීමට හේතු වූයේ රාජ්‍ය ටයර් සංයුක්ත මණ්ඩලයේ නිමැවුම සියයට 100 කින් වැඩියෙන් ඉහළ යාමය.

නිමැවුමෙහි සියයට 136 ක වැඩිවීමක් සටහන් වූ ගඩොල් සහ උළු නිෂ්පාදිත උප ගණය හැරුන විට ලෝහ නොවන ඛනිජ ද්‍රව්‍ය නිෂ්පාදිත ගණයෙහි අනෙක් උප ගණවල නිමැවුම්හි සැළකිය යුතු වැඩිවීම් සටහන්වී නොමැත. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයේ උප ගණයේ 1971 දී සටහන් වී ඇති සියයට 11·4 ක වැඩිවීම ඉකුත් වර්ෂ 4 දී වාර්තාවූ සියයට 22 ක වැඩිවීමට වඩා අඩුවිය.

මූලික ලෝහ භාණ්ඩ ගණයෙහි නිමැවුම සියයට 50·6 කින් සැළකිය යුතු ලෙස ඉහළ යාමට මුළුමනින්ම දායකවී ඇත්තේ එක් රාජ්‍ය ව්‍යවසායකි. සකස් කරන ලද ලෝහ නිෂ්පාදිත ප්‍රධාන ගණයෙහි මුළු නිමැවුම් වටිනාකමෙහි වැඩිවීම සියයට 6·8 ක් වුවද සකස් කරන ලද ලෝහ නිෂ්පාදිත (යන්ත්‍රෝපකරණ හැර) උප ගණයෙහි පමණක් නිමැවුම සියයට 32·1 ක තරම් වැඩිවීමක් වාර්තාවිය. මූලික ලෝහ නිෂ්පාදිත ගණයෙහි නිමැවුම ඉහළ යාම හා සකස් කරන ලද ලෝහ නිෂ්පාදිත උප ගණය නිමැවුම අතර කැපී පෙනෙන සම්බන්ධතාවයක් දිස් වෙයි.

මූලික ලෝහ නිෂ්පාදිත ගණයේ නිමැවුමෙහි වූ තියුණු වැඩිවීම සකස් කළ ලෝහ නිෂ්පාදිත උප ගණයේ නිමැවුම නංවාලීමට හේතුවී ඇත. නිමැවුම් වටිනාකමෙහි වැඩිවීම අනුව කාර්මික උප ගණයන්ගේ වර්ගීකරණයක් II (ආ) 2 (1) සංඛ්‍යා සටහනෙහි දක්වේ.

## II (ආ) 2 (1) සංඛ්‍යා සටහන

| රු: 0 – රු. දශලක්ෂ 5 දක්වා | රු. දශලක්ෂ 5 – 20 දක්වා | රු. දශලක්ෂ 20 – 50 දක්වා | රු. දශලක්ෂ 50 ට වැඩි |
|---|---|---|---|
| විස්කෝතු සහ රස කැවිලි | සැකසූ ආහාර | එළවළු තෙල් සහ මේද | විවිධ රසායනික ද්‍රව්‍ය |
| පාවහන් සහ සම් නිෂ්පාදන | කල්තැබිය හැකි ආහාර | රබර් නිෂ්පාදන | |
| දැව | දුම්කොළ | ගඩොල් සහ උළු | |
| තුනී ලෑලි | ගොතන ලද සහ මැසූ ඇඳුම් | සකස් කළ ලෝහ භාණ්ඩ | |
| කාර්මික රසායනික ද්‍රව්‍ය | නූල් කැටීම සහ රෙදිපිළි විවීම | | |
| ප්ලාස්ටික් නිෂ්පාදිත | කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන | | |
| පිහන් නිෂ්පාදන | පැට්‍රොලියම් සහ ගල් අඟුරු | | |
| ඉල්මනයිට් නිෂ්පාදිත භාණ්ඩ අ. ස. නො. | වීදුරු සහ වීදුරු නිෂ්පාදන | | |
| | සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදන | | |
| | යකඩ සහ වානේ | | |

පාන වර්ග හා ස්ප්‍රීතු, යන්ත්‍රෝපකරණ (විදුලි යන්ත්‍රෝපකරණ හැර) හා ප්‍රවාහන උප කරණ හා විදුලි යන්ත්‍ර උප ගණයන්හි හැර අන් සියළුම කාර්මික උප ගණවල නිමැවුම්හි වැඩි වීම් දක්විණි. නිෂ්පාදනයේ වැඩිවීම අතින් 1970 දී රුපියල් දශලක්ෂ 0 සිට 5 දක්වා කාණ්ඩයට අයත්වූ විවිධ රසායනික නිෂ්පාදිත ගණයෙහි නිමැවුම 1971 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 50 කටත් අධික වැඩිම ඉහළ යාම සටහන් කළේය. 1970 දී රුපියල් දශලක්ෂ 0 සිට 5 දක්වා කාණ්ඩයට අයත්වූ එළවළු තෙල් සහ මේද හා රබර් නිෂ්පාදිත ගණයන්හිද රුපියල් දශලක්ෂ 5 සිට 20 දක්වා කාණ්ඩයට අයත්වූ සකස් කරන ලද ලෝහ නිෂ්පාදිත ගණයෙහිද නිමැවුම් 1971 දී රුපියල් දශලක්ෂ 20 සිට 50 දක්වා කාණ්ඩයට අයත් වන ලෙස වර්ධනය වී ඇත. අනෙක් අතට 1970 දී නිමැවුමෙහි රුපියල් දශලක්ෂ 5 සිට 20 දක්වා වැඩිවීම් දක්වූ උප ගණයන් දෙකක්ද රුපියල් දශලක්ෂ 20 සිට 50 දක්වා වැඩිවීමක් දක්වූ එක් උප ගණයක්ද මෙම වර්ෂයේදී පිළිවෙලින් රුපියල් දශලක්ෂ 0 සිට 5 දක්වා කාණ්ඩයටද රුපියල් දශලක්ෂ 5 සිට 20 දක්වා කාණ්ඩයටද ඇතුළත්ව ඇත.

### II (ආ) 2 (2) සංඛ්‍යා සටහන

### වාර්තා සැපයූ ආයතන සංඛ්‍යාව සහ නිෂ්පාදන වටිනාකම

| | කාර්මික ගණය | වාර්තා සැපයූ ව්‍යාපාරික ආයතන සංඛ්‍යාවේ වෙනස | නිෂ්පාදන වටිනාකමෙහි වෙනස, (රුපියල් දශලක්ෂ) |
|---|---|---|---|
| I. | ආහාරපාන සහ දුම්කොළ .. | − 122 | + 58·5 |
| II. | රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් කර්මාන්ත .. | − 104 | + 23·5 |
| III. | දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදිත .. | + 4 | + 5·4 |
| IV. | කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදිත .. | වෙනසක් නොමැත | + 5·3 |
| V. | රසායනද්‍රව්‍ය, ඛනිජතෙල්, ගල් අඟුරු සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදිත | වෙනසක් නොමැත | + 122·5 |
| VI. | ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ගල් අඟුරු හා ඛනිජ තෙල් හැර) .. | − 16 | + 37·6 |
| VII. | මූලික ලෝහ නිෂ්පාදිත .. | වෙනසක් නොමැත | + 19·7 |
| VIII. | සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදිත .. | + 59 | + 17·4 |
| IX. | නිෂ්පාදිත භාණ්ඩ අ. ස. නො. .. | + 15 | + 4·5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1970/71 කාලය තුළදී ප්‍රධාන කර්මාන්ත ගණයන් 9 යට අයත් කර්මාන්ත ඒකක සංඛ්‍යාවෙහි සිදුවූ වෙනස්වීම් හා ඒ අනුව සිදුවූ නිමැවුම් වටිනාකම්හි වෙනස්වීම් II (ආ) 2 (2) සංඛ්‍යා සටහනෙහි දක්වේ. සමහර ප්‍රධාන කර්මාන්ත ගණයන්හි පිළිතුරු සැපයූ කර්මාන්ත ඒකක සංඛ්‍යාව පහළ වැටුනද සියළුම කර්මාන්ත ගණයන්හි නිමැවුම් වටිනාකම් ඉහළ ගොස් ඇත. ආහාර පාන හා දුම්කොළ නිෂ්පාදිත ගණයෙහි පිළිතුරු සැපයූ කර්මාන්ත ඒකක සංඛ්‍යාව අඩුවීමට හේතු වූයේ අමුද්‍රව්‍ය හිඟවීම හේතු කොට ගෙන නිෂ්පාදනය නවත්වන ලද බීඩි නිෂ්පාදන ඒකක 100 ක් පමණ ඉවත් කිරීමය. රෙදිපිළි ඇඳුම් පැළඳුම් හා සම් නිෂ්පාදිත ගණයෙහි කර්මාන්ත ඒකක සංඛ්‍යාව විශාල ලෙස වැඩිවීමට හේතුවී ඇත්තේ ඇඳුම් පැළඳුම් උප ගණයට එක්වූ අතිරේක කර්මාන්ත ඒකකයන්ය. කර්මාන්ත ඒකක සංඛ්‍යාවෙහි වෙනසක් සිදු නොවූ රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත ගණයෙහි නිමැවුම සැළකිය යුතු ලෙස ඉහළ යාමට හේතු වූයේ එම ගණයෙහි ප්‍රමානික ඒකක කීපයක නිමැවුම ඉහළ යාමය.

## 3. කාර්මික කිරීමේ ව්‍යුහය හා රටාව

II (ආ) 2 සංඛ්‍යා සටහනෙහි 1967, 1971 කාලච්ඡේදය සඳහා නිමැවුම් වටිනාකම දක්වන සංඛ්‍යා තොරතුරු නිෂ්පාදන රටාවේ ස්ථිර ප්‍රවණතාවයක් දක්වයි. මුළු නිමැවුමෙහි, ආහාර පාන වර්ග සහ දුම්කොළ සහ රෙදිපිළි, ඇඳුම් පැළඳුම්, සම්භාණ්ඩ නිෂ්පාදිත ගණයන්ගේ ප්‍රතිශත කොටස් 1967 දී පිළිවෙලින් සියයට 44·3 සහ සියයට 18·6 ක්වූ අතර 1971 දී

## II (ආ) 3 සංඛ්‍යා සටහන

### 1967—71 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම ප්‍රධාන ආර්ථික ගණ අනුව.

| | රුපියල් දශ ලක්ෂ | | | | | සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1967 | 1968 | 1969 | 1970 | 1971 | 1967 | 1968 | 1969 | 1970 | 1971 |
| **අ. පාරිභෝගික භාණ්ඩ** | **528 9** | **694·8** | **841·4** | **926·4** | **1164·6** | **55·4** | **49·7** | **51·7** | **47·6** | **52·0** |
| I· ආහාරපාන හා දුම්කොළ | 185·7 | 238·4 | 287·6 | 346·7 | 428·0 | 19·5 | 17·0 | 17·7 | 17·8 | 19·1 |
| අ. සැකසූ ආහාර1 | 33·7 | 40 8 | 45·8 | 82·9 | 139 0 | 3·5 | 2·9 | 2·8 | 4·3 | 6·2 |
| ආ. කල්තැබිය හැකි සහ ටින්වල අසුරන ලද පලතුරු, එළවළු, මස්, මාළු සහ අනෙකුත් මුහුදු ආහාර(2) | 6·7 | 8·4 | 8·6 | 11·8 | 23·2 | 0·7 | 0·6 | 0·5 | 0·6 | 1·0 |
| ඇ. බිස්කෝතු සහ රසකැවිලි | 33·3 | 44·3 | 49·9 | 50·5 | 53·1 | 3·5 | 3·2 | 3·1 | 2·6 | 2·4 |
| ඈ. සිසිල් බීම | 14·5 | 17·3 | 17·9 | 26·6 | 26·1 | 1·5 | 1·2 | 1·1 | 1·4 | 1·2 |
| ඉ. අරක්කු, බීර, ස්ටවුට් යනාදිය (3) | 5·5 | 17·1 | 59·5 | 68·3 | 62,1 | 0·6 | 1·2 | 3·7 | 3·5 | 2·8 |
| ඊ. දුම්කොළ | 92·0 | 110·5 | 105·9 | 106·6 | 124·9 | 9·7 | 7·9 | 6·5 | 5·5 | 5·5 |
| II. ඇඳුම් පැළඳුම්(4) | 48·1 | 55·7 | 56·0 | 64·3 | 70·8 | 5·0 | 4·0 | 3·4 | 3·3 | 3·7 |
| III පාවහන් සහ සම් භාණ්ඩ | 31·9 | 32·4 | 38·9 | 45·1 | 46·0 | 3·3 | 2·3 | 2·4 | 2·3 | 2·0 |
| IV. විවිධ රසායනික භාණ්ඩ (5) | 98·2 | 118·9 | 155·6 | 155·9 | 230·3 | 10·3 | 8·5 | 9·6 | 8·0 | 10·3 |
| V. කඩදාසි නිෂ්පාදිතයන් සහ කඩදාසි භාණ්ඩ (6) | 20·8 | 19·4 | 13·4 | 13·1 | 18·0 | 2·2 | 1·4 | 0·8 | 0·7 | 0·8 |
| VI සැදූ ලෝහ භාණ්ඩ යන්ත්‍රෝපකරණ හැර (7) | 7·7 | 9·1 | 13·1 | 3·4 | 3·6 | 0·8 | 0·7 | 0·8 | 0·2 | 0·2 |
| VII ප්ලාස්ටික් භාණ්ඩ | 15·9 | 32·5 | 28·2 | 32·8 | 37·7 | 1·8 | 2·3 | 1·7 | 1·7 | 1·7 |
| VIII. වීදුරු සහ වීදුරු භාණ්ඩ | — | 4·8 | 7·7 | 8·1 | 13·9 | — | 0·3 | 0·5 | 0·4 | 0·6 |
| IX. පිඟන් බඩු | 4·4 | 8·5 | 8·7 | 8·0 | 8·5 | 0·5 | 0·6 | 0·5 | 0·4 | 0·4 |
| X. රබර් භාණ්ඩ (8) | 14·0 | 28·2 | 41·3 | 46·7 | 82·1 | 1·4 | 2·0 | 2·5 | 2·4 | 3·7 |
| XI. නූල් කැටීම, රෙදිපිළි විවීම හා නිම කිරීම | 97·1 | 136·2 | 172·2 | 173·3 | 189·4 | 10·2 | 9·7 | 10·6 | 8·9 | 8·4 |
| XII. දැව නිෂ්පාදන | 3·6 | 8·0 | 9·2 | 10·4 | 12·8 | 0·4 | 0·6 | 0·6 | 0·5 | 0·6 |
| XIII. නිෂ්පාදිත භාණ්ඩ අන් තැනක සඳහන් නොවූ(9) | 1·5 | 2·7 | 9·5 | 18·6 | 23·1 | 0·1 | 0·2 | 0·6 | 1·0 | 1·0 |
| **ආ. අන්තර් භාණ්ඩ** | **297·2** | **478·8** | **505·2** | **699·2** | **692 0** | **31·2** | **34·2** | **31·1** | **36·0** | **30·9** |
| I ආහාර නිෂ්පාදිතයන් (10) | 236·6 | 371·2 | 354·2 | 337·8 | 314·6 | 24·8 | 26·5 | 21·8 | 17·4 | 14·0 |
| II සැදූ ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) (11) | 8·5 | 8·9 | 10·7 | 11·5 | 15·1 | 0·9 | 0·6 | 0·7 | 0·6 | 0·7 |
| III. කඩදාසි නිෂ්පාදිතයන් සහ කඩදාසි භාණ්ඩ (12) | 13·9 | 35·2 | 48·9 | 51·9 | 52·3 | 1·5 | 2·5 | 3·0 | 2·7 | 2·3 |
| IV. තුනී ලෑලි | 6·8 | 8·9 | 8·8 | 10·8 | 13·8 | 0·7 | 0·6 | 0·5 | 0·6 | 0·6 |
| V. ඉල්මනයිට් නිෂ්පාදිතයන් | 1·4 | 2·2 | 3·1 | 4·7 | 6·2 | 0·1 | 0·2 | 0·2 | 0·2 | 0·3 |
| VI. කාර්මික රසායන (13) | 1·9 | 2·3 | 2·2 | 3·1 | 3·3 | 0·2 | 0·2 | 0·1 | 0·2 | 0·2 |
| VII. විදුලි යන්ත්‍ර සූත්‍ර, මෙවලම්, උපකරණ සහ සැපයුම් | 28·1 | 41·8 | 66·3 | 88·4 | 88·2 | 3·0 | 3·0 | 4·1 | 4·5 | 3·9 |
| VIII. පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදිතයන් | — | 8·3 | 11·0 | 191·0 | 198·5 | — | 0·6 | 0·7 | 9·8 | 8·9 |
| **ඇ. ආයෝජන භාණ්ඩ** | **128·1** | **225·0** | **280·2** | **319·4** | **382 8** | **13·4** | **16·1** | **17·2** | **16·4** | **17·1** |
| I. සැදූ ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) (14) | 37·9 | 61·5 | 58·2 | 82·0 | 109·3 | 4·0 | 4·4 | 3·5 | 4·2 | 4·9 |
| II. රබර් භාණ්ඩ (15) | 6·7 | 13·0 | 11·5 | 9·7 | 9·8 | 0·7 | 0·9 | 0·7 | 0·5 | 0·4 |
| III. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිතයන් සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන් | 53·5 | 70·0 | 89·0 | 104·8 | 116·7 | 5·6 | 5·0 | 5·5 | 5·4 | 5·2 |
| IV. යන්ත්‍ර සූත්‍ර (විදුලි යන්ත්‍ර හැර) සහ ප්‍රවාහණ උපකරණ | 19·8 | 45 9 | 77·9 | 70·8 | 57·3 | 2·0 | 3·3 | 4·8 | 3·6 | 2·6 |
| V. ගඩොල් සහ උළු | 10·2* | 7·3 | 14·8 | 13·2 | 31·1 | 1·1 | 0·5 | 0·9 | 0·7 | 1·4 |
| VI. යකඩ සහ වානේ මූලික කර්මාන්ත (16) | — | 27·3 | 28·8 | 38·9 | 58·6 | — | 2·0 | 1·8 | 2·0 | 2·6 |
| එකතුව | 954·2 | 1398·6 | 1626 8 | 1945·0 | 2239·4 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* වීදුරු නිෂ්පාදිත අඩංගු වේ.

1· කිරි නිෂ්පාදන, අයිස්ක්‍රීම් සහ ලුණු යනාදිය.

2· ජෑම් වර්ග, ජෙලි වර්ග, සෝස් වර්ග, පලතුරු කෝඩියල්යනාදිය

3· අරක්කු නිෂ්පාදන සංඛ්‍යා 1968, 1969, 1970 සහ වශ 1971 සඳහාය

4· කමිස, බැනියම්, යනාදිය.

5· ඖෂධ්‍ය ද්‍රව්‍ය, අංගරාග සබන් සහ පවිත්‍ර කිරීමේ සංයෝග, ගිනි පෙට්ටි, දන්තාලේප යනාදිය

6· ලියන කඩදාසි, අභ්‍යාස පොත් යනාදිය.

7· ඇලුමිනියම් භාණ්ඩ.

8· මෝටර් රථ සහ බයිසිකල් ටයර් සහ ටියුබ්, සෙල්ලම් බඩු හා ගෘහෝපකරණ

9· බුරුසු, ගල්ලෑලි, මුද්‍රණ බ්ලොක්, සෙල්ලම්, බඩු හා සංගීත භාණ්ඩ යනාදිය.

10· ගව සහ කුකුල් ආහාර, එළවළු තෙල් වර්ග, අයිස් කපාපුපොල් යනාදිය.

11· භාජන.

12· මුද්‍රණ කඩදාසි, කාටන්, අනිකුත් ඇසුරුම් පෙට්ටි, සහ ඔතන කඩදාසි.

13· කෝස්ටික් සෝඩා සහ ක්ලෝරීන්,

14· කටු කම්බි, කම්බි ඇණ, ගැල්වනයිස්භාණ්ඩ යනාදිය.

15· වයර් නැවත පිරවීම.

16· රෝල් සහ කම්බි භාණ්ඩ.

## II (ආ) 4 සංඛ්‍යා සටහන

## 1971 නිෂ්පාදන සමාගම් විශාලත්වය අනුව බෙදීගිය අයුරු නිමැවුම් වටිනාකම පදනම් කොට

| කාර්මික ගණය | | නිමැවුම් වටිනාකම | | | |
|---|---|---|---|---|---|
| | | රුපියල් 250 දහසට අඩු | රු. 250 දහසේ සිට රු. ලක්ෂ 2 දක්වා | රු. ලක්ෂ 2 හා ඊට වැඩි | එකතුව |
| I. ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | සමාගම් ගණන | 113 | 31 | 25 | 169 |
| | නිමැවුමේ % ගණන | 2·7 | 6·6 | 90·7 | 100·0 |
| II. රෙදි පිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත | සමාගම් ගණන | 540 | 71 | 23 | 634 |
| | නිමැවුමේ % ගණන | 8·9 | 16·8 | 74·3 | 100·0 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) | සමාගම් ගණන | 8 | 4 | 3 | 15 |
| | නිමැවුමේ % ගණන | 2·6 | 12·4 | 85·0 | 100·0 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදිත | සමාගම් ගණන | 39 | 28 | 7 | 74 |
| | නිමැවුමේ % ගණන | 4·4 | 27·3 | 68·3 | 100·0 |
| V. රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | සමාගම් ගණන | 161 | 54 | 29 | 244 |
| | නිමැවුමේ % ගණන | 1·9 | 7·0 | 91·1 | 100·0 |
| VI. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) | සමාගම් ගණන | 31 | 11 | 9 | 51 |
| | නිමැවුමේ % ගණන | 1·5 | 4·6 | 93·9 | 100·0 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් | සමාගම් ගණන | — | — | 1 | 1 |
| | නිමැවුමේ % ගණන | — | — | 100·0 | 100·0 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදිතයන් | සමාගම් ගණන | 163 | 84 | 40 | 287 |
| | නිමැවුමේ % ගණන | 4·4 | 22·8 | 72·8 | 100·0 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවන) | සමාගම් ගණන | 49 | 12 | 3 | 64 |
| | නිමැවුමේ % ගණන | 12·8 | 35·0 | 52·2 | 100·0 |
| එකතුව | සමාගම් ගණන | 1104 | 295 | 140 | 1539 |
| | නිමැවුමේ % ගණන | 3·9 | 11·8 | 84·5 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

මෙම කොටස් සියයට 33·2 සහ සියයට 13·7 දක්වා ක්‍රමයෙන් අඩුවී ඇත. 1967 දී මුළු නිමැවුමෙන් සියයට 62·9 කට දායකවූ මෙම ද්වි ගණයන් 1971 දී දායකවී ඇත්තේ මුළු නිමැවුමෙන් සියයට 46·9 ක පමණි. 1967 දී පිළිවෙලින් සියයට 14·3 හා සියයට 10·7 සිට 1971 දී පිළිවෙලින් සියයට 25·1 සහ සියයට 12·1 දක්වා නිමැවුමේ අනුක්‍රමික වැඩිවීමක් දක්වූ රසායනික ද්‍රව්‍ය හා සකස් කළ ලෝහ නිෂ්පාදිත ගණයන්හි මීට ප්‍රතිවිරුද්ධ උපනතියක් දක්වෙයි.

මව් කාණ්ඩයන් තුළ තම කොටස් සැළකිය යුතු ලෙස වර්ධනය කර ගත් උපගණයන් වනුයේ විවිධ රසායනික නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත, ගඩොල් සහ උළු හා සකස් කළ ලෝහ නිෂ්පාදිතය.

II (ආ) 3 සංඛ්‍යා සටහන ප්‍රධාන ආර්ථික ගණ වශයෙන් එනම්, පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ, ආයෝජන භාණ්ඩද වශයෙන් වර්ග කොට ඇත. පාරිභෝගික භාණ්ඩ අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ පිළිවෙලින් මුළු නිමැවුමෙන් සියයට 52 ක් 31 ක් සහ 17 ක් විය.

ඉහත කී කාණ්ඩයන්හි ඒ ඒ කොටස්වල සැළකිය යුතු වෙනසක් නොවුවද පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයෙහි නිමැවුම් වටිනාකමෙහි සියයට 4·4 ක සුළු වැඩිවීමක් සටහන් විය. ඒ අතර අන්තර් භාණ්ඩ ගණයෙහි ඒ හා සමාන පහත වැටීමක් සිදුවිය. නිමැවුමෙහි ·වැඩිවීමට ප්‍රධාන වශයෙන් දායකවූ පාරිභෝගික භාණ්ඩ නම් කිරි ආහාර, කල් තබා ගත හැකි හා ටින් වල ඇසුරු ආහාර, කමිස, සබන් සුවඳ විලවුන් සහ බෙහෙත් ද්‍රව්‍ය වූ අතර නිමැවුමෙහි අඩුවීම සටහන් කළ අනුරූප අන්තර් භාණ්ඩ වූයේ ලෝහ භාජන, විදුලි යන්ත්‍ර සහ සැපයුම්, ඛනිජ තෙල් හා ගල් අඟුරු නිෂ්පාදිතයන්ය. ආයෝජන භාණ්ඩ ගණයෙහි ගඩොල්, උළු, සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතවල නිමැවුම්හි කැපී පෙනෙන වැඩිවීම සිදුවී ඇත.

## II (අ) 4 (1) සංඛ්‍යා සටහන

### තෝරාගත් ව්‍යාපාරයන්හි නිෂ්පාදන වටිනාකම, සේවා නියුක්තිය සහ වැටුප් බිල

| කර්මාන්තය | ව්‍යාපාර සංඛ්‍යාව (1) | සේවා නියුක්තිය (2) | වැටුප් බිල (රුපි. දහස්) (3) | නිෂ්පාදන වටිනාකම (රුපි. දහස්) (4) | මුළු නිමැවුමෙ ප්‍රතිශතයක් වශයෙන් (5) |
|---|---|---|---|---|---|
| 1· සකස් කළ ආහාර .. | 11 | 5,224 | 16.285 | 170,686 | 64·9 |
| 2· කල් තැබිය හැකි සහ ටින්වල අසුරනලද ආහාර .. | 6 | 593 | 1,330 | 20,116 | 86·7 |
| 3· විස්කෝතු සහ රසකැවිලි .. | 7 | 1,042 | 2,447 | 33,853 | 63·8 |
| 4· පාන වර්ග .. | 5 | 1,775 | 7,150 | 38,993 | 44·2 |
| 5· දුම්කොළ .. | 1 | 2,143 | 15,524 | 110,246 | 88·3 |
| 6· ඇඳුම් පැළඳුම් .. | 15 | 2,203 | 4,484 | 44,774 | 63·2 |
| 7· නූල් කැටීම සහ රෙදිපිළි වියීම .. | 15 | 8,630 | 22,271 | 167,246 | 88·3 |
| 8· පාවහන් සහ සම් .. | 7 | 2,248 | 8,085 | 40,346 | 87·7 |
| 9· දැව .. | 4 | 1,395 | 4,013 | 11,046 | 86·3 |
| 10· කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත .. | 13 | 2,988 | 9,319 | 56,740 | 80·7 |
| 11· විවිධ රසායනික ද්‍රව්‍ය .. | 21 | 3,816 | 16,253 | 209,858 | 91·1 |
| 12· ඛනිජ තෙල් සහ ගල් අඟුරු නිෂ්පාදිත .. | 2 | 772 | 4,651 | 198,497 | 100·0 |
| 13· රබර් නිෂ්පාදිත .. | 4 | 3,601 | 14,112 | 71,637 | 78·0 |
| 14· ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 11 | 1,401 | 3,653 | 29,682 | 78·7 |
| 15· වීදුරු සහ වීදුරු නිෂ්පාදිත .. | 3 | 844 | 2,491 | 12,589 | 90·6 |
| 16· සිමෙන්ති සහ ඇස්බැස්ටෝස් .. | 4 | 3,373 | 14,174 | 115,002 | 98·5 |
| 17· ගඩොල් සහ උළු .. | 3 | 1,303 | 2,562 | 27,412 | 88·1 |
| 18· සකස් කළ ලෝහ නිෂ්පාදිත .. | 27 | 4,549 | 15,290 | 103,205 | 80·6 |
| 19· යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ .. | 11 | 2,755 | 7,895 | 42,825 | 74·7 |
| 20· විදුලි යන්ත්‍ර සූත්‍ර .. | 21 | 2,573 | 7,770 | 83,816 | 95·0 |
| 21· නිෂ්පාදිත භාණ්ඩ (අන්තැනක සඳහන් නොවන) .. | 5 | 494 | 1,300 | 15,005 | 65·0 |
| එකතුව | 197 (10·4*) | 53,722 (54·6*) | 181,059 (73·9*) | 1,603,574 (71·6*) | 71·6 |
| මුළු එකතුව | 1,897 | 98,365 | 245,000 | 2,239·4 | |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1 දශ ලක්ෂයකට අධික නිෂ්පාදන වටිනාකම

* මුළු එකතුවෙහි ප්‍රතිශතයක් වශයෙන්.

## II (ආ) 5 සංඛ්‍යා සටහන

## 1971 නිෂ්පාදන සමාගම්, විශාලත්වය අනුව බෙදී ගිය අයුරු-වැටුප් පිරිවැය පදනම් කොට

| කාර්මික ගණය | | රුපි. 15 දහසට අඩු | රුපි. 15 දහස — 50 දහසට අඩු | රුපි. 50 දහස— 500 දහසට අඩු | රුපි. 500 දහස සහ වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| I. ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදිත .. .. .. | සමාගම් ගණන .. | 87 | 35 | 34 | 13 | 169 |
| | වැටුප් වැයේ % ගණන .. | 1·5 | 3·1 | 15·1 | 80·3 | 100·0 |
| II. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් භාණ්ඩ කර්මාන්ත .. | සමාගම් ගණන .. | 464 | 94 | 62 | 14 | 634 |
| | වැටුප් වැයේ % ගණන .. | 5·8 | 5·6 | 19·0 | 69·6 | 100·0 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. .. | සමාගම් ගණන .. | 3 | 6 | 3 | 3 | 15 |
| | වැටුප් වැයේ % ගණන .. | 0·2 | 1·6 | 4·9 | 93·3 | 100·0 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදිත .. .. | සමාගම් ගණන .. | 30 | 21 | 21 | 2 | 74 |
| | වැටුප් වැයේ % ගණන .. | 2·0 | 5·2 | 32·0 | 60·8 | 100·0 |
| V. රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදිත .. .. .. | සමාගම් ගණන .. | 123 | 55 | 49 | 17 | 244 |
| | වැටුප් වැයේ % ගණන .. | 1·5 | 2·9 | 15·7 | 79·9 | 100· |
| VI. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. .. .. .. | සමාගම් ගණන .. | 11 | 16 | 16 | 8 | 51 |
| | වැටුප් වැයේ % ගණන .. | 0·3 | 1·9 | 7·8 | 90·0 | 100·0 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් .. .. .. | සමාගම් ගණන .. | – | – | – | 1 | 1 |
| | වැටුප් වැයේ % ගණන .. | – | – | – | 100·0 | 100·0 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදිත .. .. .. | සමාගම් ගණන .. | 98 | 80 | 93 | 16 | 287 |
| | වැටුප් වැයේ % ගණන .. | 1·7 | 6·0 | 40·8 | 51·5 | 100·0 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන්තැනක නොසඳහන්) .. .. | සමාගම් ගණන .. | 34 | 16 | 13 | 1 | 64 |
| | වැටුප් වැයේ % ගණන .. | 8·1 | 18·1 | 53·6 | 20·2 | 100·0 |
| එකතුව .. .. .. | සමාගම් ගණන .. | 850 | 323 | 291 | 75 | 1539 |
| | වැටුප් වැයේ % ගණන .. | 2·3 | 4·1 | 20·6 | 73·0 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 4. කාර්මික ඒකකයන්හි විශාලත්වය

II (ආ) 4 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි නිමැවුම් වටිනාකම පදනම් කොට සැකසූ කාර්මික ඒකකයන්හි විශාලත්වය පිළිබඳ දත්තයන්ගෙන් පෙනී යනුයේ නිමැවුමෙන් වැඩි කොටසක් විශාල ව්‍යාපාරයන් කිහිපයක් අතර ඒකාග්‍ර වී ඇති බැව්ය. මුළු ඒකක 1,539 අතුරින් නිමැවුම් වටිනාකම රු. 2,50,000/= ට අඩු ඒකක 1,104 ක් මුළු නිමැවුමෙන් සියයට 3·7 කට දයකවූ අතර, නිමැවුම් වටිනාකම රුපියල් දශලක්ෂ 2 කට වැඩිවූ ඒකක 140 ක් විසින් මුළු නිමැවුමෙන් සියයට 84·5 ක් සපයා ඇත. ඉකුත් වර්ෂ පහට අදළ සංඛ්‍යා තොරතුරුවලින් මෙම උපනතිය පැහැදිළි වේ. වඩා විශාල ඒකකයන්ගේ ප්‍රතිශත කොටස ක්‍රමයෙන් වර්ධනය වී ඇත. විශාල ආයතන විසින් මුළු නිපැයුමෙන් අත් කොට ගත් අනුප්‍රමාණ කොටස 1967 සිට වැඩිවෙමින් පවතී. 1967 දී නිමැවුම රුපියල් දශලක්ෂ 2 ට වැඩි විශාල ඒකකයන් මුළු නිමැවුමෙන් සියයට 66·4 කට දායකවූ අතර රුපි: 2,50,000 අඩු කර්මාන්ත ඒකක දයක වූයේ මුළු නිමැවුමෙන් සියයට 8·3 ක් පමණි. 1970 දී මුළු නිමැවුමෙහි පළමුව සඳහන් කළ ගණයෙහි කොටස සියයට 82·8 දක්වා වැඩිවූ අතර දෙවනුව සඳහන් කළ ගණයෙහි කොටස සියයට 4·0 දක්වා අඩුවී ඇත. II (ආ) 4 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති කාණ්ඩයන් තුළ නිමැවුම බෙදී යාමේ රටාවේ වෙනසක් සිදු නොවූවද, ගණයන් කීපයක නිමැවුම මහාප්‍රාමාණික ඒකකයන් වෙත ඒකාග්‍රවීමේ වෙනසක් සිදුවී ඇත. රෙදි පිළි, කඩදසි, සකස් කළ ලෝහ නිෂ්පාදිත සහ අන් තැනක සඳහන් නොකළ නිෂ්පාදිත භාණ්ඩ ගණයන්හි නිමැවුම විශාල ඒකකයන් (රුපියල් දශලක්ෂ 2 හා ඊට වැඩි) කෙරෙහි ඒකාග්‍රවීම අනෙක් ගණයන්හි ඒකාග්‍රවීමට වඩා තුලනාත්මකව අඩුවන අතර ඉහත සඳහන් ගණ හතරෙහි මධ්‍යප්‍රාමාණික ඒකකයන් (රුපි. 2,50,000 වැඩි සහ රුපියල් දශලක්ෂ 2 අඩු) නිමැවුමෙන් සැළකිය යුතු කොටසකට දයකවී ඇත.

පාවහන් සහ සම් නිෂ්පාදිත කර්මාන්තයන්හි ඒකක තුනක් නිමැවුමෙන් සියයට 70 කට දයකවී ඇති අතර සිසිල්බීම සහ විස්කෝතු කර්මාන්තයන්හි ඒකක දෙක බැගින් එම කර්මාන්තයන්හි නිමැවුමෙන් පිළිවෙලින් සියයට 86 ක සහ සියයට 83 ක් නිපදවා ඇත.

වැටුප් බිල මත පදනම්වූ ව්‍යාපාරයන්ගේ ක්‍රමානුකූල විසිරී යාම පිළිබඳ II (ආ) 5 යන සංඛ්‍යා සටහනෙහි දත්තයන්ගෙන්ද වැටුප් විශාල ඒකකයන් කීපයක ඒකාග්‍රවීමේ එවැනිම උපනතියක් පෙන්නුම් කෙරේ. 1971 දී ඒකක 1,539 ක් අතුරෙන් නිමැවුම රු: 5,00,000 කට වැඩි ඒකකයන් 75 මුළු වැටුප් බිලෙන් සියයට 73 කට දයක වූ අතර නිමැවුම රු: 15,000 කට අඩු ඒකකයන් 850 ක් දයක වූයේ ; මුළු වැටුප් බිලෙන් සියයට 2·3 ක් පමණි. නිමැවුම රු: 15,000 ට අඩු ආයතන වල මුළු නිමැවුමේ කොටස 1967 දී සියයට 4·1 සිට 1971 දී සියයට 2·3 දක්වා අඩුවී ඇති අතර නිමැවුම රු: 5,00,000 වැඩි ආයතනවල කොටස සියයට 58·4 සිට සියයට 73.0 දක්වා වැඩිවී ඇත. II (ආ) 4 (1) සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති රුපියල් දශලක්ෂයකට වැඩි නිමැවුමක් ඇති කාර්මික ඒකකයන් පිළිබඳ තොරතුරු වලින්, නිමැවුමෙන්, වැටුප් බිලෙන් හා සේවක සංඛ්‍යාවෙන් වැඩි කොටසක් විශාල කර්මාන්ත ඒකකයන් කීපයක් මත රඳා පවතින මෙරට කාර්මික නිෂ්පාදනයේ නැම්යාව පිළිබිඹු වේ. ඒකක 197 ක් නැතහොත් මුළු ඒකක ගණනින් සියයට 10·4 විසින් මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 54.6 ක්ද මුළු වැටුප් බිලෙන් සියයට 73·9 ක්ද කාර්මික නිමැවුමේ මුළු වටිනාකමින් සියයට 71·6 ක්ද අයත් කොට ගෙන ඇති බව පෙනේ.

## 5. සේවා නියුක්තිය හා වැටුප්

1971 වර්ෂය තුළදී වාර්තා සපයා ඇති කර්මාන්ත ඒකකයන්ගේ සංඛ්‍යාව මුළු වශයෙන් ගත්කළ ආන්තික වැඩිවීමක් සිදුවී ඇතත් සේවක සංඛ්‍යාව 1,05,105 සිට 98,365 දක්වා අඩුවී ඇත. මෙයින් මුළු ශ්‍රමික දින ගණනෙහි සියයට 19·5 ක පමණ අඩුවීමක් පිළිබිඹු කරයි. සේවක සංඛ්‍යාව හා ශ්‍රමික දින ගණන් අඩුවී ඇතත් මුළු වැටුප් ප්‍රමාණයෙහි නිමැවුමෙහි සහ ශ්‍රමික දිනයකට වෙන්කළ හැකි වැටුපෙහි වැඩිවීම වාර්තාවී ඇත.

මුළු සේවක සංඛ්‍යාවෙහි අඩුවීමට ප්‍රධාන හේතු වශයෙන් දැක්විය හැක්කේ ආහාර පාන සහ දුම්කොළ ගණයෙහි බීඩි නිෂ්පාදන ඒකක 100 ක් පමණ නිෂ්පාදන නතර කොට තිබීමත්, රෙදිපිළි, ඇඳුම් පැළඳුම්, සම් නිෂ්පාදිත ගණයෙහි නූල් කැටීම, රෙදි වියීම සහ නිම කිරීම යන උප ගණයෙහි සේවක සංඛ්‍යාව අඩුවීමත්ය. එසේ වුවද මෙම කර්මාන්ත ගණයන්හි ප්‍රමාණික ඒකක කීපයක නිමැවුමේ සැළකිය යුතු වැඩි වීමක් වාර්තාගතවී ඇති හෙයින් මෙම ගණ දෙකෙහි සේවක සංඛ්‍යාව අඩු වුවද එය මුළු නිෂ්පාදනය කෙරෙහි බලපා නොමැත.

වාර්තා සැපයූ ව්‍යාපාරයන්ගේ මුළු වැටුප් බිල 1970 දී රුපියල් දශලක්ෂ 229·4 ක් වූ අතර 1971 දී රුපියල් දශලක්ෂ 245·0 ක් විය. මෙයින් සියයට 6·8 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. රසායනික ද්‍රව්‍ය (සියයට 22·8), සකස් කරන ලද ලෝහ නිෂ්පාදිත (සියයට 35·4) ගණයන්හි වේතනවල වැඩිවීමක් වාර්තා ගතවූ අතර, ආහාර පාන හා දුම්කොළ (සියයට 7·1) සහ රෙදිපිළි ඇඳුම් පැළඳුම් හා හම් නිශ්පාදිත (සියයට 5·9) ගණයන්හි වේතනවල පහත වැටීමක් සිදුවී ඇත. ඉහළම වැටුප් බිල් සහිත ගණයන් වූයේ ආහාර පාන හා දුම්කොළ (සියයට 24·4), සහ රසායනික ද්‍රව්‍ය (සියයට 19·6) කර්මාන්තය මුළු නිමැවුමෙන් සියයට 58·3 ක් නිපදවූ මෙම ද්වි ගණයෙහි මුළු වැටුප් බිලෙන් සියයට 44·0 ක් ලබාගත් සේවකයින් 38,928 දෙනෙක් හෙවත් මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 39·6 ක් සේවයේ යෙදී සිටියහ.

ප්‍රධාන ගණ 9 යෙහිම ශ්‍රමික දිනකට වෙන්කළ හැකි වැටුප වැඩිවී ඇති අතර 1971 දී කාර්මික ක්ෂේත්‍රයේ වැටුප් වැඩිවීම් එයින් පිළිබිඹු වේ. අවුරුද්ද තුළදී සියළුම ප්‍රධාන ගණයන්හි වැඩකරන ලද ශ්‍රමික දින ගණන පහත වැටී ඇති අතර සේවකයකු වෙනුවෙන් වෙන්කළ හැකි මිනිස් දින ගණන දක්වන සංඛ්‍යා තොරතුරු වලින් එය අනාවරණය වේ. 1971 වර්ෂයේ මුල් භාගය තුළදී රටතුළ උද්ගත වූ කලබලකාරි තත්ත්වය හේතුකොට ගෙන කාර්මික ක්ෂේත්‍රයේ ක්‍රියාවලිය තාවකාලිකව ඇන හිටීම මෙයට හේතුවී යයි ගෙනහැර දැක්විය හැකිය.

## 6. අමු ද්‍රව්‍ය පරිහරණය

II (අ) 6 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති අයුරු, පාවිච්චි කරන ලද අමු ද්‍රව්‍යවල වටිනාකම නිමැවුම් වටිනාකමෙන් සියයට 50 ක් පමණ විය. එහෙත් දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයේ අමුද්‍රව්‍ය පරිහරණ රටාවේ 1971 වර්ෂය තුළදීත් වෙනසක් සිදු නොවිණි. ඉකුත් වර්ෂයන්හිදී මෙන් මෙම වර්ෂයේහිදීද කර්මාන්ත ක්ෂේත්‍රය විසින් පාවිච්චි කරන ලද අමු ද්‍රව්‍යවලින් සියයට 75 ක් ආනයනය කළ ඒවා විය. කර්මාන්ත ක්ෂේත්‍රයේ විවිධ ගණයන්ට අදාළ සංඛ්‍යා තොරතුරු සවිස්තරාත්මකව විශ්ලේෂණය කිරීමේදී පෙනී යන දිරිගන්වන සුළු කරුණක් වනුයේ යටත් පිරිසෙයින් කර්මාන්ත ගණයන් දෙකක, එනම් ආහාර පාන හා දුම්කොළ සහ රෙදිපිළි, ඇඳුම් පැළඳුම් හා සම්භාණ්ඩ කර්මාන්ත ගණයන්හි පාවිච්චි කරන ලද දේශීය හා විදේශීය අමුද්‍රව්‍ය අතර ඇති අනුපාතයෙහි කැපී පෙනෙන වෙනස්වීමක් සිදුවීමය. මෙම ද්වි ගණයෙහි දේශීය සංයුක්තය 1970 දී පිළිවෙලින් සියයට 37·6 ක් සහ සියයට 26·9 ක් වූ අතර 1971 දී එය පිළිවෙලින් සියයට 42·4 සහ සියයට 40·3 දක්වා වැඩිවී ඇත. වෙනත් ගණයන් යටතේ එන විවිධ රසායනික ද්‍රව්‍ය, රබර් නිෂ්පාදිත, සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදිත හා ඇස්බැස්ටෝස් නිෂ්පාදිත උප ගණයන්හි දේශීය අමුද්‍රව්‍ය පාවිච්චි කරන ලද මුළු අමුද්‍රව්‍ය ප්‍රමාණයෙන් සියයට 50 ක් පමණ වේ.

වැඩි වශයෙන් දේශීය අමු ද්‍රව්‍ය උපයෝගී කොට ගන්නා කර්මාන්ත දිරිගැන්වීමෙත් සහ නහා සිටුවීමෙත් රජයේ ප්‍රතිපත්තිය හේතුකොට ගෙන අමු ද්‍රව්‍ය පාවිච්චි කිරීමේ රටාවේ වෙනසක් ඇති විය හැකි අතර, එමගින් අමු ද්‍රව්‍ය ආනයනය කිරීමේ අඩුවීමක් ඇතිවිය හැකිය.

## II (ආ) 6 සංඛ්‍යා සටහන
## නිෂ්පාදනය සහ අමු ද්‍රව්‍ය — 1971

රුපියල් දහස් ගණනින්

| කාර්මික ගණය | ව්‍යාපාරික ආයතන | නිෂ්පාදනය රු. දශලක්ෂ | අමු ද්‍රව්‍ය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | දේශීය | | විදේශීය | | එකතුව | |
| | | | වටිනාකම | සියයට ගණන | වටිනාකම | සියයට ගණන | වටිනාකම | සියයට ගණන |
| I. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත .. | 148 | 312·5 | 63,698 | 42·4 | 86,576 | 57·6 | 150,274 | 100·0 |
| II. රෙදිපිළි, ඇඳුම් පැලඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්තය .. | 615 | 252·3 | 42,283 | 40·3 | 62,560 | 59·7 | 104,843 | 100·0 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 12 | 20·8 | 5,073 | 85·7 | 844 | 14·3 | 5,917 | 100·0 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදිත .. .. | 65 | 61·9 | 8,465 | 24·8 | 25,710 | 75·2 | 34,175 | 100·0 |
| V. රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදිත .. | 232 | 524·1 | 44,333 | 15·8 | 236,328 | 84·2 | 280,661 | 100·0 |
| VI. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 46 | 157·2 | 10,223 | 34·0 | 19,825 | 66·0 | 30,048 | 100·0 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් .. .. | 1 | 58·6 | — | — | 40,027 | 100·0 | 40,027 | 100·0 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදිත .. .. | 242 | 226·2 | 23,264 | 18·2 | 104,603 | 81·8 | 127,867 | 100·0 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක නොසඳහන්) .. | 60 | 20·9 | 1,943 | 21·5 | 7,076 | 78·5 | 9,019 | 100·0 |
| එකතුව .. | 1,421 | 1634·5 | 199,282 | 25·5 | 583,549 | 74·5 | 782,831 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## 7. බලය සහ ඉන්ධන පරිභරණය

II (ආ) 7 සංඛ්‍යා සටහනෙහි දැක්වෙන අයුරු පාවිච්චි කරන ලද බලය සහ ඉන්ධනවල වටිනාකම නිමැවුම් වටිනාකමෙන් සියයට තුනක් විය. පාවිච්චි කළ පෙට්‍රල් හා තෙල්වල වටිනාකම බලය සහ ඉන්ධනවල මුළු වටිනාකමෙන් සියයට 53·3 ක් වූ අතර, විදුලි බලය සහ ගල් අඟුරු සහ ගෑස්වල වටිනාකම පිළිවෙලින් සියයට 42·2 ක් සහ සියයට 2·2 ක් විය. විදුලි බලය විශාල වශයෙන් උපයෝගී කර ගන්නා කර්මාන්ත ගණයන් වනුයේ ආහාර පාන හා දුම්කොළ, කඩදසි සහ කඩදසි නිෂ්පාදිත, මූලික ලෝහ නිෂ්පාදිත සහ සකස් කරන ලද ලෝහ නිෂ්පාදිත යන්ත්‍ර හා ප්‍රවාහණ උපකරණ යන කර්මාන්තයන්ය. රසායනික ද්‍රව්‍ය හා ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත ගණයන්හි ප්‍රධාන ඉන්ධන වන පැට්‍රෝල් සහ තෙල් වැඩි වශයෙන් ප්‍රයෝජනයට ගත් අනෙක් ඉන්ධනයන්ය.

### II (ආ) 7 සංඛ්‍යා සටහන

### නිෂ්පාදනය සහ ඉන්ධන — 1971

| කාර්මික ගණය | සමාගම් ගණන | නිෂ්පාදනය (රුපියල් දශලක්ෂ) | පාවිච්චි කළ ඉන්ධන (රුපියල් දහස් ගණනින්) | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | විදුලි බලය | ගල් අඟුරු සහ ගෑස් | පැට්‍රෝල් සහ තෙල් | අනෙකුත් | එකතුව |
| I. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත .. | 114 | 267·7 | 1,617 | 191 | 735 | 25 | 2,568 |
| II. රෙදිපිළි, ඇඳුම් පැලඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්තය .. | 309 | 228·1 | 2,297 | 102 | 1,940 | 30 | 4,369 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 11 | 20·7 | 118 | 5 | 181 | 5 | 309 |
| IV කඩදසි සහ කඩදසි භාණ්ඩ නිෂ්පාදිත .. | 52 | 53·8 | 1,044 | 18 | 746 | – | 1,808 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදිත . | 158 | 394·1 | 6,430 | 69 | 7,337 | 65 | 13,901 |
| VI. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 41 | 165·2 | 2,969 | ... | 10,739 | 109 | 13,817 |
| VII. මූලික ලෝහ නිෂ්පාදිතයන් .. | 1 | 58·6 | 1,623 | – | 947 | – | 2,570 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදිත .. | 193 | 212·2 | 3,217 | 615 | 1,595 | 24 | 5,451 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවන) | 41 | 17·2 | 129 | 12 | 16 | 8 | 165 |
| එකතුව .. | 920 | 1,417·6 | 19,444 | 1,012 | 24,236 | 266 | 44,958 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## II (ආ) 8 වැනි සංඛ්‍යා සටහන

## පළාත් අනුව කර්මාන්තයන්හි පිහිටීම

| කාර්මික ගණය | බස්නාහිර පළාත | | උතුරු පළාත | | දකුණු පළාත | | නැගෙනහිර පළාත | | මධ්‍යම පළාත | | වයඹ පළාත | | උතුරු මැද පළාත | | සබරගමු පළාත | | ඌව පළාත | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | ප්‍රතිශතය |
| 1· ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදිත .. .. | 86 | 69·4 | 8 | 6·5 | 7 | 5·6 | 3 | 2·4 | 9 | 7·3 | 6 | 4·8 | — | — | 2 | 1·6 | 3 | 2·4 | 124 | 100·0 |
| 2· රෙදිපිළි, ඇඳුම් සහ සම් කර්මාන්තය .. .. | 419 | 75·7 | 18 | 3·3 | 35 | 6·3 | 9 | 1·6 | 38 | 6·3 | 12 | 2·2 | — | — | 16 | 2·9 | 6 | 1·1 | 553 | 100·0 |
| 3· දව සහ දව නිෂ්පාදිත (ගෘහභාණ්ඩ ඇතුළුව)· .. | 9 | 75·0 | — | — | 2 | 16·7 | — | — | 1 | 8·3 | — | — | — | — | — | — | — | — | 12 | 100·0 |
| 4· කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදිත .. .. | 56 | 91·8 | 2 | 3·3 | 3 | 4·9 | — | — | — | — | — | — | — | — | — | — | — | — | 61 | 100·0 |
| 5· රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල් ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදිත .. .. | 176 | 81·5 | 7 | 3·2 | 8 | 3·7 | — | — | 11 | 5·1 | 6 | 2·8 | 2 | 0·9 | 3 | 1·4 | 3 | 1·4 | 216 | 100·0 |
| 6· ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) .. | 36 | 81·9 | — | — | 1 | 2·3 | 2 | 4·5 | 2 | 4·5 | 2 | 4·5 | — | — | 1 | 2·3 | — | — | 44 | 1·0·0 |
| 7· මූලික ලෝහ නිෂ්පාදිත .. .. | 1 | 100·0 | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | 1 | 100·0 |
| 8· සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ .. .. | 231 | 84·0 | 14 | 5·1 | 14 | 5·1 | 1 | 0·3 | 12 | 4·4 | 3 | 1·1 | — | — | — | — | — | — | 275 | 100·0 |
| 9· නිෂ්පාදිත භාණ්ඩ අ· ස· නො· .. .. | 26 | 83·9 | 1 | 3·2 | 3 | 9·7 | — | — | — | — | 1 | 3·2 | — | — | — | — | — | — | 31 | 100·0 |
| .. .. | 1040 | 78·94 | 50 | 3·80 | 73 | 5·54 | 15 | 1·14 | 73 | 5·55 | 30 | 2·29 | 2 | 0·15 | 22 | 1·67 | 12 | 0·92 | 1317 | 100·0 |

මූලය. ශ්‍රී ලංකා මහ බැංකුව